**වර්ෂ 2022 ජූලි මස 08 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව.**

- **සභාපතිතුමා මූලසුන ගැනීම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය නොමැති හෙයින් විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 09.45 දක්වා කල් තැබීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.සෝමරත්න මහතා විසින් යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|
| 1. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.25 |
| 2. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.30 |
| 3. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය | පෙ.ව. 08.35 |
| 4. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 08.40 |
| 5. ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 09.10 |
| 6. ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 09.10 |
| 7. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 09.12 |
| 8. ගරුප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 09.15 |
| 9. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.30 |
| 10. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජී.එම්. ජයරත්න | පෙ.ව. 09.31 |
| 11. ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 09.35 |
| 12. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.33 |
| 13. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 09.35 |
| 14. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.45 |
| 15. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 09.45 |
| 16. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 09.45 |
| 17. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඩබ්.කේ.තිලකාවතී.මිය | පෙ.ව. 09.45 |
| 18. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 09.52 |
| 19. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 09.55 |
| 20. ගරුප්‍රාසම | එ.ජා.ප. | ජී.ර්.ඒ. රනිල් එදිරිසිංහ | පෙ.ව. 09.55 |
| 21. ගරු ප්‍රාසම | එ.ජා.ප | මුදිතා ශ්‍රීමති .මිය | පෙ.ව. 10.00 |
| 22. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 10.00 |
| 23. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 10.10 |
| 24. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 10.10 |
| 25. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | එස්.ඩබ්.රන්ජිත් මෙන්ඩිස් මහතා | පෙ.ව. 10.20 |
| 26. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 10.21 |
| 27. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 10.22 |
| 28. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.24 |
| 29. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.24 |
| 30. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 10.25 |
| 31. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 11.30 |
| 32. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 11.30 |
| 33. ගරු ප්‍රාසම | එ.ජා.ප | අයි.කේ.කුලරත්න මහතා | පෙ.ව. 11.45 |
| 34.ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී. ජීවන් අබේවික්‍රමපාල | පෙ.ව. 11.46 |
| 35.ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරඳන මිය | පෙ.ව. 11.46 |
| 36.ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.රත්නසිරි මහතා | පෙ.ව. 11.50 |
| 37.ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 11.55 |
| 38.ගරු ප්‍රාසම | එ.ජා.ප. | ඩී.ආර්. විනෝද් මහතා | පෙ.ව. 11.55 |
| 39.ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 12.00 |
| 40.ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 12.10 |
| 41.ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.ඩබ්.ජයලත් | පෙ.ව. 12.10 |

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.-(2022.06.10 )**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා :-**

2022.06.10 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී.ප්‍රේමා ගම්ලත් මිය :-**

2022.06.10වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

1.2022.06.10 වන දින මහ සභා වාර්තාවේ අංක 05-14,15 සභා තීරන දෙවතාවක් මුද්‍රනය වි ඇත.මෙම දෝෂය ඉවත්විය යුතුය.

2. 2022.06.10 වන දින මහ සභා වාර්තාවේ යෝජනා අංක 05-09 හි ගරු සභාපතිතුමා විසින් අදහස් දැක්වීමේදි කුරුවිට ප්‍රාදේශිය සභා වෙලඳ සංකීර්නයේ ඉහල මහලේ සම්මන්ත්‍රන ශාලාව ඉදිකිරිම 02 අධියර ව්‍යාපෘතියේ මුළු වටිනාකම රු.1650730.52 ලෙස සදහන් කල අතර එය රු.16507310.52 ලෙස සංශෝධනය විය යුතුය.

**Xxxxxxxxxxxxx** 2022.06.10 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2. **<u>සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -</u>**

**<u>03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද ලිපි සංදේශ , පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන -නොමැත</u>**

<u>04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> -ගරු ප්‍රාසම ජී.එම් ජයරත්න මහතා විසින් ඉදිරිපත්කර ඇති පහත ප්‍රශ්න.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

මෙම ප්‍රශ්න සඳහා පහත පරිදි පිලිතුරු සපයමි.

1.2018 වර්ෂයේ සිට මේ දක්වා කොපමන විදි ලාම්පු ප්‍රමානයක් මෙම සභාවට මිලදී ගෙන ඇත්ද?

23 වොට් විදි පහන් සෙට් ප්‍රමානය 4041 ක් වන අතර ඒ සඳහා වැයවූමුදල රු.13737400.00 ක්වේ.

150වොට් වීදිපහන් සෙට් ප්‍රමානය 1101 ක් වන අතර ඒ සඳහා වැයවූ මුදල රු.17112500.00 ක් වේ.

<u>අළුත්වැඩියා සඳහා මිලදී ගැනිම්</u>

| | | |
|---|---|---|
| බල්බ් 2601 සඳහා | රු.2534510.00 | |
| වයර්රෝල් 459 සඳහා | රු.1112890.00 | |
| ස්විච් 195 සඳහා | රු. 162500.00 | |
| කන්ඩියුම් බට 1000 | රු.125000.00 | |
| ලයින්ටෝප් 1800 | රු.558000.00 | මේ සඳහා මුළු මුදල 4507750.00 |

2.ඒ සඳහා වැයවූ මුදල කොපමනද? ඉහත දක්වා ඇත.

3.එම විදි ලාම්පු සවිකරන ලද ප්‍රමානයන් කොට්ඨාශ අනුව වෙන් වෙන්ව දැක්විය හැකිද?

සවිකරන ලද ප්‍රමානයන්

23වොට් විදි පහන් සෙට් 3965

150 විදිපහන් සෙට් 811

මුළු 4776 එසේම අළුත්වැඩියා වලින් ඉතිරි වූ ප්‍රමානයන් මෙසේය.

බල්බ් 609,සිවිච් 285,ලයින්ටැප් ජෝඩු 950 වයර් රෝල් 30 කන්ඩියුම් බට 64 වේ.

කොට්ඨාශ අනුව වෙන් වෙන්වතොරතුරු ඉදිරිපත්කිරීම සඳහා ,ගරු මන්ත්‍රිතුමන්ලාගේ නමින් පහන් නිකුත් කර ඇති බැවින් කොට්ටාශ මට්ටමින් වෙන් වෙන්ව ඉදිරිපත්කල නොහැක.තවද

මහජන ඉල්ලීම් විවිධ කොට්ඨාශ වලින් බොදුවේ ලැබෙන බැවින් කොට්ටාශ මට්ටමින් වෙන් වෙන්ව සවි කරන ලද විදි පහන් ප්‍රමානය ඉදිරි සභාවට ඉදිරිපත්කරමි. ගරු මන්ත්‍රීතුමන්ලා මේ සඳහා හැකි තොරතුරු ලබා දී සහාය වෙන්න.

4.එය කොපමනද?
5.මෙම විදිපහන් වලින් කොපමන ප්‍රමානයක් දැනට ක්‍රියාත්මකද? 2022 06.31 දින වන විට පහන් ප්‍රමානය හා එයින් මේවන විට අක්‍රියව පවතින වීදි පහන් ප්‍රමානය කොපමනද යන්න පිලිබඳව ඒ ඒ කොට්ඨාශය භාර මන්ත්‍රීවරයාට සභාව දැනුවත්කරන ලෙසද ඉල්ලමි.
6.වගකීම් කාලය තුල ක්‍රියා විරහිත වු පහන් කොපමන නැවත අළුත්වැඩියා වලට අදාල මිලදිගත් ආයතන වෙත යොමු කර ඇත්ද? 104 වේ.
7.ඉන් කොපමන නැවත ලැබී ඇත්ද?මෙම ප්‍රමානයෙන් නැවත අළුත්වැඩියා කර ලැබිය යුතු ප්‍රමානය 27 කි.
මෙම ප්‍රශ්නවල පිලිතුරු දිය නොහැකි වූ ප්‍රශ්න සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනිමට ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහාය අපේක්ෂා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා :-</u>

**මෙම වීදි පහන් කොපමන දැවි ඇත්ද යන්න දැන ගැනිම වැදගත්.පහන්වල ප්‍රමිතිය උසස්ද යන්න දැනගත හැකියි.අපේ ප්‍රෙද්ශයේ ඇතැම් පහන් පිච්චිලා.සමහර ඒවා රෑට දවල්ට දෙකටම දැල්වෙන ඒවා.දැඩි අවධානය යොමු කරන්න.**

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී නයනා ජිවනි මිය-</u>
**මෙම විදි පහන් පිලිබඳව මම මීට පෙර දිනකදි යෝජනාවක් කලා.අංක කර නියමිත ලේඛනයක් පවත්වාගෙන යන්න කියලා.යම් මන්ත්‍රිවරයෙක්ට මේ පහන් දුන්නාම ඒ නම යටතේ අංක 1 සිට අංක කරනවා.ඒ සවිකල ස්ථානය සමග.යම් දෝෂයක් දැනුම් දුන්විට අදාල ලේඛනයෙන් සියළු තොරතුරු ගත හැකියි වගේම සියළු ප්‍රමානයන් දෝෂ සහිත ප්‍රමානයන් ආදියද මේ ලෙස සටහන් කර තොරතුරු ගත හැකියි.නිලධාරීන්ට ලේසියෙන් දත්ත ගන්න පුළුවන්.අද සිටවත් මේ ක්‍රමය අනුගමනය කරන්න.අද මේ සවිකල ප්‍රමානයන් පිච්චුන ප්‍රමානයන් සොයා ගැනිම ගැටළුවක් වෙලා.ලබන වසරේවත් කරන්න.ගිය වසරේ මේ ගැන කිවාම කීවේ සියළු තොරතුරු තියෙනවා කියලා.නමුත් මේ කිව දේ කලා නම් අද තොරතුරු ගන්න තිබුනා.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**ගරු මන්ත්‍රිතුමියගේ අදහස හරි.ඉදිරියේදි ඒලෙස අංක කර ලේඛන පවත්වාගෙන කටයුතු කරමු.**

## <u>5.යථා පරිදි කල්දී ඇති යෝජනා :-</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022.07.08 දින පැවති මහා සභාවේ තීරන අංක 05-01 උදෘතය**

**05-01.** පැරඩැයිස් වැව සම්බන්ධව පැනනැගී ඇති ගැටළුව සම්බන්ධ යෝජනාව
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා

පැරඩැයිස් වැව සම්බන්ධව දැන් ගැටළු රැසක්.වැව වටේ බැනර් දාලා,පෝස්ටර්ස් දාලා .වැව වටේ ඇවිදින මංතීරුවක් හදන්න අපි යෝජනා කලත් මේ වන විට ව්‍යාපාරිකයෙක් වැව සුද්ධ කරලා රෝන මඩ අයින් කරන්න යනවළු.අපේ නමුත් ගැවිලා.අපි විරුද්ධයි ඒකට.අපි දැනුවත් නෑ.කෘෂි දෙපාර්තමේන්තුව දන්නෑ.කවුරුවත් අවසර දීලා නෑ.මේ සම්බන්ධයෙන් සොයා බලලා.නිවැරදි තොරතුරු ලබාදෙන්න.එසේම රැස්වීම් තියලා ජනතාව දැනුවත්කරන්න.නිවැරදි තොරතුරු දෙන්න. පැරඩැයිස් වැව සම්බන්ධව පැනනැගී ඇති ගැටළුව පිලිබඳව සියළු විස්තර සභාව හා අවශ්‍ය අංශ වෙත ලබාදිමට කටයුතුකරන ලෙස රාජ්‍ය මැනික් සංස්ථාවට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වදැනුම් දීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-

මෙම යෝජනාව ස්ථිර කරමි.මෙය සත්‍ය කරුනක්.මේක තිරය පිටුපස බලවතුන් ඉන්නවා ඇති.මංකොල්ලාකෑමක්.මේ වැව හදලා තියෙන්නේ පහල වෙල්යාය පෝෂනය කරන්න.ඒ අවට හා පොලව යට මැනික් තියෙනවළු. මිනිසුසු හොරෙන් ගරනවා.ඒක අතීතයේ සිට වූ දෙයක්.ගමේ අහිංසක මිනිස්සු.නමුත් ධනපති පන්තිය විශාල සකර් දාලා මැෂින් දාලා ගරනවා.ඒක මංකොල්ල කෑමක්.

මේකට කෙටුම්පත් හදලා.මේ සම්බන්ධයෙන් මටත් දුරකථන ඇමතුම් ආවා.නිහඬ කිරීමේ ප්‍රතිපත්තිය නමුත් අපි පාවාදීම් කරන්නෑ.අවුරුදු 26 ට මං එවැනි දේ කරලත් නෑ.සියළු අංශ දැනුවත් කරන්න.බෙනර් ගැසීම සාදාරනයි.මේක ඇත්ත.සල්ලි ඇති ධනපති අයයි මේක මූලික පිරිස.මේවා ගනුදෙනු.අද අපිත් අසරන වෙලා.කැත දේශපාලනය නිසා.මේ විරෝධතාවයට මාත් සහායවෙනවා.එදාත් අපි විරුද්ධ වුනා. තනියෙන්.එදා මට ගැටළු ඇතිවුනා. මේ බැකෝ පතල් වලට විරුද්ධ වුනා කියලා.අද වනවිට මේ ප්‍රෙද්ශ නැත්තටම නැතිවෙලා.විශාල ජලාශ වගේ වලවල් ඇතිවෙලා.අද ලිං හිදිලා ,ගෙවල් ඉරිතලලා මේ විනාශයන්ට එරෙහි වෙලා අපි විරෝධතාවය දක්වමු.එකතුවෙලා මේ ගැටළුව විසඳගමු.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණි චන්ද්‍රලතා බන්ඩාර මිය :-

ස්ථිරයි. අද වනවිට ලොකු ව්‍යාපාරිකයෝ එක්ක පිරිසක් වැවේ පතල් කපනවා.ප්‍රාෙදේශිය සබාව හරහා දෙන වතුර ටිකවත් ගන්න බෑ.වැව බොර වෙලා.පොලිසිය මැදිහත්කරලා මෙක් නතර කරන්න.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-

වැව ඉදිරිපිට විවිධ පෝස්ටර්ස් ගහලා.ජොගිං පාත් කන්නද? කියලා.එසේම වැවේ රොන්මඩ ඉවත්කරනවළු.මංතීරු කතාව කීවේ ගමේ මිනිස්සු. ගමේ මිනිස්සු විරෝධය දක්වනවා.මේ වැව පෝෂනය වෙන්නේ වැහි ජලයෙන්.ජලය රදන්නේ මේ රොන් මඩ එක්ක.ඒත් රොන්මඩ ඉවත් කලොත් හිදෙනවා.වැවේ වතුර අල්ලගන්න තමා මේ රෝන්මඩ තියෙන්නේ.ඒක මම දන්නේ

අපේ ගමේ ඌරුපැච්ච වැවව මම යම් සංවර්ධන කටයුත්තක් කලා.එක් ගමක එක් වැඩක් යටතේ. එතනදි මේ වැවේ රොන්මඩ ඉවත් නොකර තමා ඒක කලේ.වැව වටා ප්‍රතිසංස්කරනයක් කලා.අතිතයේ ඉදන් එන ඒ රොන්මඩ ඉවත් නොකිරීමේ පිලිවෙත සත්‍යයක්.මැණික් ගැරිම ඔලුවේ තියාගෙන මේ වැවව සම්බන්ධව කටයුතු කලොත් වැව කලපුවක් වෙයි.අනික මේ වැව හැදීම හදිසි කටයුත්තක් නෙවේ.ජලය තියෙනවා. කුඹුරට යනවා.මේ වැව ව්‍යාපාරිකයෝ ග්‍රහනය කරලා.අපි පොඩි කාලේ පතල් කැපුවා.දිනයක් කැපුවොත් පුෂ්පරාගයක් වගේ හම්බුවෙනවජේත් මේ වගේ ධනපති ව්‍යාපාරිකයන් පිටින් ඇවිත් විශාල පරිමානෙන් මේක කලොත් ගමට ඇති සෙතක් නෑ.ගම්මු කලොත් ගමට හොදයි.මේ මහා පරිමාන විනාශයට එරෙහි වෙමු.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

මේ සම්බන්ධයෙන් ලිපියකුත් ඇවිත්.සම්පත් සුභසාධක සමිතියෙන්.මා දන්න තරමින් අපි සභාතේ කතා කලා අර ඇවිදින මංතීරු හදන්න වැව සංරක්ෂනය කරලා අපිට පුළුවන් ලිපියක් දෙන්න. දීලත් තියෙනවා.නමුත් මේ වන තුරු කෙරුනේ නෑ.මගේ පුද්ගලික මතය පොලවේ සම්පත් මේ යුගයේ මිනිස්සු අරගත්තට කමක් නෑ.නමුත් ඒ සම්පත ගමේ අය සමග බෙදා ගත යුතුයි.නමුත අපි මේ ගැන තාම දන්නේ නෑ.ව්‍යාපාර කරන අය ඒවා දියුනු කර ගත යුතුයි.සමාජයටත් හොඳයි.මැනික් ව්‍යාපාර කරන අය පරිත්‍යාගශිලියි.නමුත් වැවට හානි වෙන්න බෑ.රොන් මඩ ඉවත් කරන්න බෑ.මේ සම්බන්ධව ගැටළු නම් සියළු අංශ දැනුවත් කල යුතුයි.ප්‍රාෙද්ශිය ලේකම් සියළු දෙනාව දැන්වත් කල යුතුයි.අපිට මේ කටයුතු එපා කියන්න බෑ.සාධාරන නම්.ඒ නිසා ගමටත් උදව් අරගෙන ප්‍රාෙද්ශිය සභාවත් හරහා කරනවානම් විනිවිදයි.රාජ්‍ය මැනික් සංස්ථාවට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ට දන්වමු සභාව ඇතුළු ස්වේච්චා සංවිධාන, පන්සල ,ගම මේ සම්බන්ධයෙන් දැනුවත්කරන්න කියලා ඉල්ලිමක් කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

මටත් පිටපතක් ලැබුනා.ගමේ ඉල්ලිම් .

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව</u> පැරඩැයිස් වැව සම්බන්ධව පැනනැගී ඇති ගැටළුව පිලිබඳව සියළු විස්තර සභාව හා අවශ්‍ය අංශ වෙත ලබාදිමට කටයුතුකරන ලෙස රාජ්‍ය මැනික් සංස්ථාවට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ට දැනුම් දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

කුරුවිට ප්‍රාදේශිය සභාවේ **2022.07.08** දින පැවති මහා සභාවේ තීරන අංක **05-01** හි සත්‍ය උදෘතයක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,

කුරුවිට.

<u>කුරුවිට ප්‍රාදේශිය සභාවේ **2022.07.08** දින පැවති මහා සභාවේ තීරන අංක **05-02** උදෘතය</u>

**05-02.කුරුවිට සමුපකාර ඉන්ධන හලෙන් ඉන්ධන ප්‍රමානයක් ගරු මන්ත්‍රිතුමන්ලාහට ලබාගැනිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා</u>

**කුරුවිට සමුපකාර ඉන්ධන හලෙන් ඉන්ධන ප්‍රමානයක් ගරු මන්ත්‍රිතුමන්ලාහට ලබාගැනිමට නිත්‍යායානුකූලව කටයුතු කරන ලෙස යෝජනා කරමි.මෙම යෝජනාව සිදු කරනු ලබන්නේ ජනතාවට සේවය සැපයීමේ කටයුතු වලට යොදා ගැනිමටයි.උදාහරනයක් ලෙස ග්‍රාමසේවා නිලධාරි ඉල්ලීමක්කලා මේ දිනවල ආධාර ලෙස දෙන සහල් ටික ප්‍රවාහනය කර ගැනීමට.නමුත් තෙල් නෑ.පැය ගනන් මිනිස්සු පයින් එන්නේ. තෙල් නැති නිසා.නමුත් අපිට ඉන්ධන පිරවුම් හලෙන් තෙල් නෑ කිවාට 1 දැ හවස තුන්දෙනෙකුට කෑන් වලට තෙල් දීලා.මම ඇහුවම මම බැන්නා කියලා ප්‍රාෙල්ට කියලා.තෙල් වැඩි මිලට පිටට විකුනලා.පාරිභොගික අධිකාරියට කීවා.ඒ අය ඇවිත් චෙක් කලා.ප්‍රමානයක් තිබිලා තෙල්.රීයේ තෙල් ගැහුවා. සභාව තමා වැඩිම තෙල් ප්‍රමානයක් මිලදි ගන්නේ.ලක්ස 14 විතර.නමුත් මේක අසාධාරනයි. අපිට සභාවට තෙල් ටිකක් ගන්න බෑ.එසේම මිනිස්සු එරත්නෙ ඉඳන් පවා එනවා පයින්. සහල් ගන්න.මේ සම්බන්ධව විරෝධය පල කරනවා.අපේ සේවවාන් ලබාදීම සඳහා රුවිට සමුපකාර ඉන්ධන හලෙන් ඉන්ධන ප්‍රමානයක් ගරු මන්ත්‍රිතුමන්ලාහට නීත්‍යායානුකූලව ලබාගැනිමට කටයුතු කරන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**එම යෝජනාව ස්තිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අසංක දිල්ෂාන් මහතා</u>

**ස්පීරයි.ඊයේ පොර්දා ඉඳලා තෙල් හංගලා කියල මමත් හිටියා ඒ අවස්ථාවේ.පන්සල පැත්තෙන් ගෙනියනවළු.ආමි එකට ඒවා නවත්වන්න බෑ. දේපල විනාශ විතරයි පුළුවන්.අපි කැමත් දුන්නා ඒ අයට.උදේ චෙක්කලා. ටැංකි.මම බැස්සා ටැංකි වලට.95,92 ඩිසල් 22000 විතර.පැට්‍රල් 1270 .අත්‍යවශය සේවා වලට දෙන්නළු. පොලිසියේ ට්‍රැපික්ටයි ගිලන්රථයට විතරයි දෙන්න ඕනි.විකුනනවා.අපේ කුනු ට්‍රැක්ටරයටත්නෑ.කවුරු හවුල්ද දන්නෑ.කොහොම වුනත් මේක ගැටළුවක්.12 දා අයිඕසි එකට තෙල් එනවව.කුරුවිටට ප්‍රමුඛවියයුතුයි.රුවන් මන්ත්‍රිතුමා කිව එක හරි.රාජ්‍ය සේවා කරන අයට වෙලාවක් දිලා නෑ.මමත් ඔපිස් ඇරිලා ආවේ.රුවන් මන්ත්‍රිතුමා වැඩ කරනවා.සමහරු බොරුවට ඉන්නවා.වැඩ කරන අයට දෙන්න.ඊයේ දුන්නේ මිඩ්වයිප්ලට. අනත්වා පොලිසියට .ඒක වෙන්නේ මාපියාව.මන්ත්‍රිතුමාලට සභාවේ වැඩවලට එන්න බෑ.තෙල්නෑ.ඒ නිසා මැදිහත්වෙලා අපිටත් තෙල් ටිකක් ගන්න කටයුතු කරන්න.ලඟ තියෙන ආයතනයට දෙන්නෑ.ක්‍රිඩා පිටිය තනකොල වැවිලා. තෙල් නැතිනිසා කපන්න බෑ.පැට්‍රල්,සහල්,නෑ.හරිම දුකයි රටගැන.සභාව මැදිහත්වෙලා ලීටර් 3 ගානේවත් තෙල් ලබාදෙන්න කටයුතු කරන්න.තියෙන ලීටර් 750 න් 200 වත් ගමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**පැතිකඩ ගනනක්.පීඩනය ඉහට උඩින් ගිහිල්ලා.පාලනය අසමත්.ඵලයන්හි විපාක ලබන්නේ.සභාව සමුපකාරය එක්ක එකතු උනත් තෙල් දිම ප්‍රතික්ෂේප කරලා.අපි ආයතනයක් ලෙස සමුපකාරයයි ප්‍රාලේවයි කැඳවා සාකච්ජා කරමු.**

එන තෙල් තොගය සාධාරනව දෙන විධිහ සාකච්ජා කරලා සමූපකාර අධ්‍යක්ෂ මණ්ඩලයයේ අනුමැතිය ගමු.සභාවට බල්ක් එකක් ඉල්ලන්න.කසල අදින්නැතිව ගමේ ඉන්න බෑ.අපිටයි දෝෂාරෝපනය.ගඳයි. ඒත් අත්‍යවශ්‍ය සේවා මුවාවෙන් ජාවාරම් වලට ඉඩ දෙන්න එපා.විධිමත් ක්‍රමයක් හදමු.සම්බන්ධීකරනයක් කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මේ තත්වය ඇත්තක්.අත්‍යවශ්‍ය රාජකාරි වලට දෙන්න ඕනි තමයි.නමුත් මේ තෙල් ප්‍රමානය සම්බන්ධව වෙනසක් වෙලා.පරික්ෂා කරන වෙලාවේ තිබුන ප්‍රමානය නෙමෙයි දැන්.ඊ ලඟට අත්‍යවශ්‍ය අයට දෙන්න ක්‍රමයක් ඕනි.තව කුරුවිට නෙමේ පිටින් එන්නේ වැඩිපුර. මේ පෝලිමට.සමහරු තෙල් පෝලිම් වල ගැටළු ඇති කරනවා.මේවා විසඳා ගත යුතුයි.රටේ පාලනයේ දූර්වලතා නිසා ජනතාවට සියල්ල ගැටළු වෙලා.පෝර ගැටළුව පිලිබඳව මමත් මුලින්ම කතා කලා.නමුත් ඇහුම්කන් දුන්නේ නෑ.පාලනය වෙනසක් විය යුතුයි.බොහෝ ගැටළු තෙල් දුන්නානම් විසඳෙනවා.කඩිනමින් ඒදෙය කල හැකි අය ලවා හෝ කරවිය යුතුයි.සාමූහික ක්‍රියා මාර්ගයක් ගත යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නයනා ජීවනි මිය</u>

මේ දිනවල ජනතාව අසිමිත දූකක් විදන්නේ තෙල් පෝලිම් වල. ගෙදරින් හෝ කඩෙන් කෑම බිම ගෙනත් තියාගෙන පෝලිම්වල.සමහරු මැරුනා.සභාවට ඉන්ධන අත්‍යවශයයි.කුණු අදින්න ඕනි.නිලධාරීන්ටත් දෙන්න ඕනි.අපිත් ජනතා කටයුතු කරනවා තමයි.නමුත් මේ වෙලාවේ අවශ්‍ය නෑ.රටේ තත්වය එක්ක මේ වෙලාවේ අපිට විශේෂයෙන් තෙල් දිමට ජනතාව විරුද්ධ වෙයි.ඒනිසා මේ වෙලාවේ මන්ත්‍රිලට තෙල් මෙසේ දිමට මම විරුද්ධයි.මේ විධිහේ යෝජනා කරන්න එපා.අපිට මිනිස්සු ගහයි.මන්ත්‍රිලට තෙල් ගැහුවා කියලා.ජනතාවගේ පොදු ප්‍රවාහනය ගමු.අපි ඒ අය නිසයි මෙතනට ආවේ.සභා කටයුතු වලට තෙල් ගන්න.මන්ත්‍රිලට ඉල්ලන්න එපා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්ප සූරිය මහතා</u>
අපේ රටේ මේ අර්බුධ හමුවේ තෙල් ප්‍රශ්නය දැඩි එකක් වෙලා.තෙල් පෝලිම් වලත් අක්‍රමිකතා.මේ තත්වය තවත් දුර ගියොත් අපිට තෙල් ගන්න වෙන්නේ පාතාලයෙන්.රෝගින් ගැබිනි මව්වරුනුත් තෙල් පෝලිමේ.මේ ගැටළුව බැරෑරුම් වෙලා.මේ යෝජනාව මන්ත්‍රිලට තෙල් දෙන්න.නමුත් අපිත් සාමාන්‍ය ජනතාව තමයි.මේක හෘර්ධ සාක්ෂියට විරුද්ධයි.අතවශ්‍ය සේවා වලට අවශ්‍යයි. මම මේකට විරුද්ධයි.ඒ වගේම මේ තෙල් පෝලිම් වලට නිශ්චිත ක්‍රමවේදයක් හදන්න.ඒවායේ දැඩි අක්‍රමිකතා.සමහරු තෙල් අරන් වැඩි මිලට විකුනනවා.විශාල අර්බුධයක්.මේවා විසඳන්න සාකච්ජා පවත්වන්න.මම මේ තෙල් සම්බන්ධ යෝජනාවට විරුද්ධයි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>
අපි සභාවට තෙල් ඉල්ලමු.වැඩ කරන්න තෙල් ඕනි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා</u>
මේ ගැටළුව ගැන මම කතා කලා ප්‍රාේද්ශිය ලේකම් එක්ක.අපිත් සමුපකාරයේ සාමාජිකයෝ අනිත් පෝලිමේ ඉදලා තෙල් ගැහුවේ.පැය 12 ක් පෝලිමේ හිටියේ.නමුත් මම මන්ත්‍රි කෙනෙක් කියලා විශේෂ යක් අවශයාා නෑ. නමුත් මට තෙල් එපා කියලා බෑ.මට අත්‍යාවශ්‍යයි.ජනතාවගේ කටයුතු සඳහා මට දුර එන්න වෙනවා.අසරන උන වෙලේ ජනතාවට දෙන හාල් ටික අරන් දෙන්න, ඒඅයට ප්‍රවාහනය කර ලා දෙන්න මට උදව් කරන්න විධිහක් නෑ.

අපිත් අසරනයි.අසනීපයක් උනත් හදිසියට කරන්න දෙයක් නෑ. එක ලඟ ගෙවල් නෑ. දුර තියෙන්නේ.ලස්සකන්ද බසය නෑ.පයින් යන්න බෑ දුරයි.මල ගෙයක් උනත් යුතුකම් ඉෂ්ට කරන්න යන්න අමාරැයි.ඒ නිසා තෙල් දෙනවනම් මටත් ලීටර් දෙකක් වත් දෙන්න.පත්තරේ දැම්මත් කමක් නෑ. තෙල් පෝලිමේ අක්‍රමිකතා තියෙනවා.මේවා විසඳන්න. ක්‍රමවේද හදන්න. ඔබතුමා මේකේ නායකත්වය ගන්න.ජනතාව අසරන වෙලා.අපි කියන දේවල් ඇහුවේ නෑ. ඇතැම් නිලධාරින් නිසාත් ආන්ඩුව වැටුනා.එරත්න ලස්සකන්ද ජනතාවට බයිසිකලේ යන්න බෑ. කඳු.බස්නෑ.තෙල් නෑ.රජයෙන් දෙන හාල් ටිකවත් ගෙනියන්න බෑ. අපි අපිවම විවේචනය කරගන්න වෙලා.ආන්ඩුවේ ක්‍රම වේද හරි නෑ.මේවාට නිසි ක්‍රමවේද හදන්න.සභාවට ලිටර් 60ක්වත් ගන්න.මන්ත්‍රීලටත් ලීටයක්වත් ගානේ දෙන්න.යන්න එන්න බෑ.සමූපකාරේ මේ වැරදි වැඩේට විරුද්ධ වෙන්න.තෙල් නෑ කීවත් දැන් තෙල් තියෙනවා.මේ වගේ දේ වලට අප්‍රසාදය දක්වලා ලිපි ලියන්න.අපිට කොළඹ ගිහින් තෙල් ගහන්න බෑ.නිසි ක්‍රමවේද හදන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා</u>

මේකට ජාතික වැඩපිලිවෙලක් ඕනි.මේ තෙල් ගෙනාවත් ඒවා බෙදීමට නිසි ක්‍රමවේදයක් නෑ. මන්ත්‍රිවරුන්ට වෙනම දෙන එක හොඳයි. ඇත්තටය දිගු පෝලිම් වල මත්පැන් බිලා එතනත් ප්‍රශ්න.රන්ඩු. අපිට විශේෂ වරප්‍රසාද ඕනි නැති උනත් මේක විශේෂ අවස්ථාවක්.මාස ගානකින් තෙල් නෑ.ෂෙඩ් එක අඳුරන අය ට කෝල් කරලා කියනවා.ඒ වගේම ජාවාරමක් වෙලා.ජනතාව වෙනුවෙන් සාකච්ජා කරලා සාධාරන ක්‍රම වේදයක් හදන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>

මේ යෝජනාවට පක්ෂව හා විපක්ෂව මත ආවා. මටත් දුන්නොත් හොඳයි. මොකද පක්ෂේ විතරක් නෙමේ අනෙක් පක්ෂ වල උනත් ගමේ මල ගෙයක් උනාම මටයි කතා කරන්නේ.රෑ 12 ට හරි මම යනවා.ගියාම ඒ අයට ආදාහනාගාරේට සල්ලි බදින්න ඕනි.මේ ලගදි ඉන්දු මිස්ට කතා කලාම රෑ 12 ට විතර ගත්තා.ආයේ කොල ටික අරන් පයින් හරි එන්න ඕනි සභාවට. ඉතින් මට නම් මේ පැට්‍රල් ඕනි.ඒ වගේම මේ ඉන්ධන පිරවුම් හල් ගත්තම රත්නපුර නාඹටුන්න පිරවුම්හල ඒක හදිසි අවශ්‍යතාවයට මානුෂියව සලකලා මට අදච් කලා. රෝහලට ආවා ගමේ මරනයක් වෙලා ගෙනියන්න.තෙල් ඉවර උනා.මට ඇත්තටම ඉන්ධන හල් හිමියා ඒ අවස්ථාවේ කඩිනමින් තෙල් ලබාදුන්නා. මේ යෝජනාව මුහුණු පොතේ තිබුනා.තෙල් පෝලිම විනයට පිටින් ඉන්නේ.ජාවාරම් කරුවන් කඩා කප්පල් කරන්න හදන්නේ.රන්ඩු නිර්මානය කරනවා.මේ කඩා කප්පල් කරන අයට දඩුවම් කරන්න ඕනි.ඒ වගේම මේ කුරුවිට පෝලිමක් තිබිල.ඒ අයට විතරද තෙල් කියන ප්‍රශ්නය නැගුවාම එතනත් ඇත්තක් තියෙනවා.පිට අය තෙල් ගහනවා.මේ ප්‍රෙද්ශයේ අයට නෑ.සීයක් දෙසියක් ඉන්නවා.වෙනම සෙට් එකක්.කුරුවිට ෂෙඩ් එකෙත් හිටියා. එකම නඩේ.මාෆියාවකුත් නිර්මානය උනා.මිනිස්සු කුපිත කරනවා.ඉතින් අපිට විශේෂත්වයක් ඕනි නෑ.පෝලිමේ ඉඳලා තෙල් ගහමු. නමුත් මම විශ්වාස කරනවා ගමේ අය තීරනය කරයි මන්ත්‍රිතුමා පෝලිමේ ඉන්න ඕනිද කියලා.පාතගම නම් කොහොම තෙල් දුන්නත් මටත් දෙයි කියලා මම විශ්වාස කරනවා.මම ගමට වැඩකලා. ඒකෙදි පක්ෂ පාට බැලුවේ නෑ.පොදුවේ වැඩ කලා.ඒ නිසා මෙසේ මන්ත්‍රිලටත් තෙල් දුන්නොත් හොඳයි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

මේ යෝජනාව විවිධ මත පල උනා. ඇත්තටම මම කතා කලා.දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ප්‍රාෙල්ට කතා කරලා සාකච්ජා කලා.පොලිසිය සෞවෙනි,හා කලමනාකරු ආවා.මම කිවා මන්ත්‍රිලටත් අවශ්‍ය බව. ප්‍රාෙල් කීවා ඉල්ලන්න කියලා.නයනා මන්ත්‍රිතුමිය විකසිත මන්ත්‍රිතුමාට එපාළු. අපි උත්සහ කරමු ගන්න. මොකද මේ ඇත ඉදන් පයින් එන්න බෑ. ජනතා කටයුතු වලටත් එන්න විදිහක් නෑ.අපේ ට්‍රක්ටර්වලටත් තෙල් නෑ කීවා.ඇත්තටම මම කතා කලා. මැනේජර්ට.පුද්ගලිකව දුරකතනයෙන් කතා කලාට සභාපතිතුමාට උස්සන්නේ නෑ.
ඒ නිසා කතා කරන්න පුළුවන් කෙනෙක් ආවොත් හොඳයි.පුද්ගලික මතය.ඒවගේම මතයක් ආවා රෑට පන්සල පැත්තෙන් තෙල් ගෙනියනවා කියලා.මේකට මැදිහත්වීමක් කරමු.අපි ලිපියක් ඇරියා ට්‍රැක්ටරය බොබ්කැට් ජේ.සිබි එකට තෙල් ගන්න.අද දෙනවා කිවත් දැන් ස්ට්‍රයික්ලු.
අපි සහෝදර ආයතනයක් උනත් ලක්ෂ ගානක තෙල් ගැහුවත් මේ වෙනකොට තෙල් නැළු.අපි ඇහැලියගොඩ හා පුස්සැල්ල පිරවුම්හල් වලටත් කතා කරලා තෙල්ගමු ඒවායිනුත්. ඇත්තටය තෙල් නෑ කිවම මට කැබ් එකට ඇහැලියගොඩින් ලිටර් **15** ක් දුන්නා. ස්තුති කරනවා.ජනතාවට සේවා සදහා මේ තෙල් අවශ්‍යයි.මේ යෝජනාව ෆේස්බුක්දාලා.සභාව අපහසුතාවයට පත් කරන විදිහේ කටයුතු කිරිම සතුටක් නම් කමක් නෑ.නමුත් අපි සේවය කල යුතුයි. මමත් මන්ත්‍රිලත් මිනිස්සු. අපි මේ යෝජනාව දිස්ත්‍රික් ලේකම්ටත් දන්වලා තෙල් ලබා ගැනිමට කටයුතු කරමු.සාකච්ජාවක් ඉල්ලමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි විකසිත පුෂ්පසූරිය මහතා</u>
මගේ සහ ජයසිංහ මන්ත්‍රිතුමාගේ විරෝධය සටහන් කරන්න.සභාවට තෙල් ඉල්ලුව ලැයිස්තුවෙන් මගේ නම ඉවත් කරන්න.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනි මිය.</u>
මගේ විරෝධතාවයත් සටහන් කරන්න.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි චන්ද්‍ර බණ්ඩාර මිය.</u>
මා හට තෙල් අවශ්‍යයි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතාගේ යෝජනාව අනුව කුරුවිට සමුපකාර ඉන්ධන හලෙන් ඉන්ධන ප්‍රමාණයක් මහජන සේවය සඳහා යොදාගැනිමට ගරු මන්ත්‍රිතුමන්ලාහට ලබාගැනිම සම්බන්ධ ව ක්‍රමවේදයක් සැකසිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022.07.08 දින පැවති මහා සභාවේ තීරන අංක 05-02 හි සත්‍ය උදෘතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

කුරුවිට ප්‍රාදේශිය සභාවේ **2022.07.08** දින පැවති මහා සභාවේ තීරන අංක **05-03** උද්‍ධෘතය

**05-03.කුරුවිට , එරත්න , මුරුත්තෙට්ටුවේකන්ද පදිංචි එම්.ජී.එන්.සි සෝමරත්න යන අය විසින් බුක්ති විදින කොන්ඩගලගාව මූකලාන නමැති ඉඩමට ඔප්පුවක් ලබාදිම සම්බන්ධ සභා තීරනයක් ගැනීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**මේ සම්බන්ධයෙන් සහකාර ප්‍රාදේශිය ලේකම් කුරුවිට විසින් ඉල්ලීම් ලිපියක් යොමුකර ඇති අතර ඒ අනුව කුරුවිට , එරත්න , මුරුත්තෙට්ටුවේකන්ද පදිංචි එම්.ජී.එන්.සී. සෝමරත්න යන අය විසින් බුක්ති විදින කොන්ඩගලගාව මූකලාන නමැති ඉඩමේ පර්චස් 40 ක් පමන භුක්ති විඳින බවත් එම බිම් කොටස ඉඩම් ඔප්පුවක් ලබා දීම සම්බන්ධව සලකා බැලිමට සභාවේ නිර්දේශ ලබාදෙන ලෙසත් දන්වා ඇත.**
**තව දුරටත් එම ඉඩම අවසාන ගම් සිතියමට අනුව සුසාන භුමියක් සදහා වෙන්කර ඇති අතර දැනට අනවසරයෙන් පුද්ගයන් කිප දෙනෙක් පදිංචිව සිටින බවත් දන්වා ඇත.**
**මේ ස්මබන්ධයෙන් මා විසින කාර්මික නිලධාරි වාර්තාවක්ද ලබා ගන්නා ලදි.ඒ අනුව මෙම ඉඩම මුරුත්තෙට්ටුව කන්ද ගමට සුසානභූමියක් සදහා වෙන් කර ඇති අතර ස්ථාන පරීක්ෂනයේදි මෙම ඉඩම සුසාන භුමියක් සඳහා හා අවශ්‍ය බවට ත් තහවුරු කර ඇත.එසේම ජනතා ඉල්ලිම්ද පවති.ඒ අනුව කුරුවිට , එරත්න , මුරුත්තෙට්ටුවේකන්ද පදිංචි එම්.ජී.එන්.සි සෝමරත්න යන අය විසින් බුක්ති විදින කොන්ඩගලගාව මූකලාන නමැති ඉඩමේ පර්චස් 40 ක ප්‍රමානය සුසානභූමියේ කටයුතු සදහා අවශ්‍ය බැවින් වෙනත් කටයුත්තක් සඳහා ලබා දිය නොහැකි බවට යෝජනා කරමි.**

ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා :-

**සෝමේ අයියා ඉන්න ඉඩම.මේ එරත්නෙ ගම්වලට සුසාන භූමිය තියෙනවා.එක්තරා කාලෙක ග්‍රාම නිලධාරි කෙනෙක් මේකට ඔප්පුව හදලා දීලා.සුසාන භූමියකට තිබුනත් භාවිතා කරලා නෑ. වගා කරලා නිසා.නමුත් සුසාන භූමිය ඉවත්කරන්නබැරි නිසා නැවත මැන්නානම් හරි.සුසාන භූමිය ඒකට අයිති නැත්ද කියලා.දෙන්න එපා කියන්නෑ.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව
**කුරුවිට, එරත්න ,කොන්ඩගලගාව මූකලාන නමැති ඉඩමේ පර්චස් 40 ක ප්‍රමානය සුසානභූමියේ කටයුතු සදහා අවශ්‍ය බැවින් වෙනත් කටයුත්තක් සඳහා ලබා නොදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-04.කුරුවිට, පහල කුරුවිට , රනසිංහාරාම පන්සල අසල පාලම අසලින් ගල්ලෙනගාව වත්තට යන පාර, සෝමා රනසිංහ මාවත ලෙස නම්කර ,නාම පුවරුවක් සවි කිරිමට සභා අනුමැතියක් ලබා ගැනීමේ යෝජනාව**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**කුරුවිට, පහල කුරුවිට , රනසිංහාරාම පන්සල අසල පාලම අසලින් ගල්ලෙනගාව වත්තට යන පාර, සෝමා රනසිංහ මාවත ලෙස නම්කර ,නාම පුවරුවක් සවි කිරිමට සභා අනුමැතියක්**

ලබා ගැනීම සම්බන්ධයෙන් ඉල්ලීමක් පහල කුරුවිට, කුරුවිට පදිංචි ශාන්ති පෙරේරා මදුරප්පෙරුම යන අය විසින් ඉදිරිපත්කර ඇත.සුදුසු තීරනයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-

ඉන්ද්‍රාණී මන්ත්‍රීතුමියත් මාත් ජීවත් වන ප්‍රදේශයේ මේ වලව්ව ඇත්තටම වලව් කමින් මිදිලා ජනතාවට සේවය කල තැනක්.රනසිංහාරාමයත් මේ පවුලේ පරිත්‍යාගයක්.මේකත් මේ පවුලේ කෙනෙකුගේ ඉල්ලිමක්.නමුත් ඇත්තටම මේ පාරක් නම් කරන ක්‍රමවේදයක් තියෙනවා.ජනතාවට සේවා කල කෙනෙක් වෙනුවෙන් ස්වේච්ඡා සංවිධාන වලින් ඉල්ලීම් කරලා ප්‍රෙද්ශයෙ අදහස් විමසලා,පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙක්ගේ මගින් අනුමැතිය අරන් කල යුතු නීත්‍යානුකූල කටයුත්තක්.මීට පෙර මාත් ඉල්ලිමක් කලා.හමුදාවේ රනවිරුවන් තිදෙනෙකු වෙනුවෙන්.යුද්ධෙදි මියගිය.රනවිරු මාවත ලෙස නම් කිරිමකට. නමුත් එය ප්‍රතික්ෂේප උනා.මේ යෝජනාවට මං විරුද්ධ නෑ.සෝමා රණසිංහ මේ පවුලේ දියනියක්.පන්සලෙන් තොරතුරුත් ගන්න පුළුවන්. නමුත් පන්සල ප්‍රෙද්ශයේ ස්වේච්ඡා ආයතන ආදියේ විස්තරත් අරන් මේකට සුදුසු තීරනයක් අරන් නීත්‍යානුකූලව කටයුතු කරන්න.මම දන්නා පරිදි ඒ පවුලේ එක් සාමාජිකයෙක් මල්ලි කෙනෙක් විරුද්ධයි මේ සම්බන්ධව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

දීප්ති මන්ත්‍රීතුමා පැවසූ ආකාරයෙන් කුරුවිට, පහල කුරුවිට , රනසිංහාරාම පන්සල අසල පාලම අසලින් ගල්ලෙනගාව වත්තට යන පාර, සෝමා රනසිංහ මාවත ලෙස නම්කර ,නාම පුවරුවක් සවි කිරිම සම්බන්ධව තව දුරටත් තොරතුරු ලබාගෙන නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කිරිමට යෝජනා කරමි.

ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව හා පහල කුරුවිට, කුරුවිට පදිංචි ශාන්ති පෙරේරා මදුරප්පෙරුම යන අය විසින් ඉදිරිපත්කර ඉල්ලීම් ලිපිය අනුවආකාරයෙන් කුරුවිට, පහල කුරුවිට , රනසිංහාරාම පන්සල අසල පාලම අසලින් ගල්ලෙනගාව වත්තට යන පාර, සෝමා රනසිංහ මාවත ලෙස නම්කර ,නාම පුවරුවක් සවි කිරිම සම්බන්ධව තව දුරටත් තොරතුරු ලබාගෙන නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**05-05.**කුරුවිට,තැඹිලියන ගොඩවෙල්යාය ආසන්නයේ තිබෙන සුසාන භූමිය තුල තාවකාලිකව බෝග වගා කිරිමට අවසර ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට,තැඹිලියන ගොඩවෙල්යාය ආසන්නයේ තිබෙන සුසාන භූමිය තුල තාවකාලිකව බෝග වගා කිරිමට අවසර ලබා ගැනීම සඳහා ඉල්ලිමක් ගෝනපිටිය පාර එක්සත් සුභසාධක සංගමය ,ගරු සභාපති විසින් විසින් ඉදිරිපත්කර ඇත.

ඒ අනුව මෙම සුසාන භූමිය මීට ඉහතදි සභාවේ මැදිහත්වීමෙන් සුද්ධ පවිත්‍ර කල අතර මේ වන විට නැවත කැලෑව බිහිවි යාබද ඉඩම් හිමියන් විසින් අනවසර කටයුතු නිසා ඉඩම් ප්‍රමානය අඩුවෙමින් යන බවද දන්වා ඇත.රටේ පවතින තත්වය සැලකිල්ලට ගෙන මිහිදන් කටයුතු වලට අවහිර නොවන පරිදි මෙම ඉඩම සුද්ධ පවිත්‍ර කර තාවකාලික බෝගයක් වගා කිරිමට සංගමය වෙත අනුමැතිය ඉල්ලා ඇත.මෙම ඉල්ලීම සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තාවක්ද ලබා දි ඇත.මෙම තත්වය සැලකිල්ලට ගෙන ගෝනපිටිය පාර එක්සත් සුහසාධක සංගමය ට කුරුවිට,තැඹිලියන ගොඩවෙල්යාය ආසන්නයේ තිබෙන සුසාන භූමිය තුල ගිවිසුමක් අනුව යම් නිශ්චිත කාලසීමාවකට තාවකාලික බෝග පමනක් වගා කිරිමට අවස්ථාවක් ලබා දීමටත් කිසිදු ආකාරයේ ඉදිකිරිමක් සිදු නොවන පරිදි හා පුද්ගලික නමට නොමැතිව සංගමය වෙත මෙම අවසරය ලබාදීමටත් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කිරිමටත් යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.මෙය කිසිදු ගැටළුවක් නොවන ලෙස කිසිදු ඉදිකිරීමක් නොවන පරිදි මෙය සිදු කල යුතුයි.

<u>ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

තාවකාලිකව දෙන්න.මෙහි ගිවිසුම නිසි කොන්දේසි සකසා හදන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>

සභාපති නමට දෙන්න . වෙනත් පුද්ගලික නම්වලට දෙන්න එපා.නිසි ගිවිසුම් හදන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව හා අනුව</u> හා ගෝනපිටිය පාර එක්සත් සුහසාධක සංගමයේ ඉල්ලීම අනුව ගෝනපිටිය පාර එක්සත් සුහසාධක සංගමය ට කුරුවිට,තැඹිලියන ගොඩවෙල්යාය ආසන්නයේ තිබෙන සුසාන භූමිය තුල ගිවිසුමක් අනුව යම් නිශ්චිත කාලසීමාවකට තාවකාලික බෝග පමනක් වගා කිරිමට අවස්ථාවක් ලබා දීමටත් කිසිදු ආකාරයේ ඉදිකිරිමක් සිදු නොවන පරිදි හා පුද්ගලික නමට නොමැතිව සංගමය වෙත මෙම අවසරය ලබාදීමටත් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

**05-06.2023 වර්ෂය සඳහා අයවැය සඳහා තොරතුරු ලබාගැනීම හා 2023 අයවැය පිළියෙල කිරීමේ කාල සටහන සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**2023 වර්ෂය සඳහා අයවැය සඳහා තොරතුරු ලබාගැනීම හා 2023 අයවැය පිලියෙල කිරීමේ කාල සටහන සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව**

**2023 වර්ෂය සඳහා අයවැය සැකසීම සඳහා ප්‍රාදේශිය සභාව සතු මාර්ග. ලිං, තොටුපලවල් පොදු වැසිකිලි ,සායන හා ප්‍රාදේශිය සභාව සතු වෙනත් පොදු පහසුකම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරිමට ඔබතුමන්ලාගේ යෝජනා 2021.07.30 දිනට පෙර මා වෙත ලබාදෙන ලෙස ඉල්ලා සිටින අතර අදාල 2023 වර්ෂය සඳහා අයවැය සැකසීමේ කාල සටහන ඔබ වෙත ලබා දි ඇත. ඒ අනුව <u>කුරුවිට ප්‍රාදේශිය සභාවේ</u> 2023 වර්ෂය සඳහා අයවැය සැකසීමේ කාල සටහන සඳහා මහා සභා අනුමැතිය ලබාදෙන ලෙස යෝජනා කරමි.**

<u>ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**
**කරුනු දෙකක් ගැන අදහස් දැක්විය යුතුයි.2023 අයවැය යෝජනා ක්‍රියාත්මක වනවිට අපි මේකේ නොඉන්නත් පුළුවන්.නමුත් අපි මේ අර්බුධ සමයේ වැඩියෙන් ජනතාවට ප්‍රතිලාභ ලැබෙන යමක් සඳහා තීරන ගත යුතුයි.ප්‍රජා ශාලාවට එහා ගිය යමක් කල යුතුයි.කතා බහ කරලා ප්‍රමුඛතා ගත කරමු.ප්‍රබතා කීපයක් හරි ඉටු කරමු.අනික එල්ලාවල පිටකන්ද පාර. අතුරු ව්‍යවස්ථා තියෙනවා. කොන්ත්‍රාත් කරු ගෙවීම් කරන්නැත්නම් ඊට විරුද්ධව කටයුතු කල හැකි නීති ප්‍රතිපාදන අනුව කටයුතු කරන්න.බලය මට දුන්නානම් මම මුදල් ලබා දෙනවා. නීතිය මගින්.සමහරු බයයි.ජනතාවට සේවය කල හැකි, අසාධාරනයට ඉඩ නොතබන අනපනත් යටපත් කරන්න ඉඩතියන්න එපා.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ</u> 2023 වර්ෂය සඳහා අයවැය සැකසීමේ කාල සටහන සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>05-.07. -ඇස්තමේන්තු- නොමැත.</u>**
**<u>06.කාරක සභාවල වාර්තා</u>**

06-01 මුදල් කමිටු වාර්තාව(2022.07.01)

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

22.07.01 දින **මුදල් කමිටු වාර්තාව** සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් **මහා** සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා :-</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-</u>
**වාර්තාවේ අංක 86 තීරනයේ බැටරි සම්බන්දව 9476 ට්‍රැක්ටර් රථයට බැටරි දාලා 2020. 10 මාසේ .අවුරුද්දක් තුල එහෙම දාන්න බැ.ගැරන්ටිය විතරක් නොවේ.අවුරුදු 5,6 ක් භාවිතා කරන්න ඕනි.ඇමරන් ඒවා වසර 5 ක් විතර තියෙනවා.විස්තර ලබාදෙන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

අංක 91.ඉවත්කරන පරන ඔයිල් විකිනිමට හැකියි.ඒවා වෙනම ගන්නවා.මේ ජේසීබී යන්ත්‍රය විශාල වියදමක්. ඇත්තටම ස්කැවේටර් එකෙනුත් පුළුවන් ඔය වැඩ ටික කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

වෙනත් තැන්වල ගාන වැඩියි. අපි ගන්නේ රු. 800 ගානේ. අනිත් තැන්වල රු. 1450.00 යි.

ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-

ඇත්තටම ස්තුති කරනවා ජයරත්න මන්ත්‍රීතුමා මග පෙන්වීම ඉතා වැදගත්.තොරතුරු නිවැරදිව සොයාබලා කරුනු විමසනවා.ගැටළු අහනවා.එතුමාට එම මිලදී ගැනිම් ආදිය නිවැරදිව විස්තර දැක්විය හැකියි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මා විස්තර ලබා ගත්තා.2020.10.19 දින අංකය සහිත බැටරිය භාරදීලා.එදා අරන් නෑ.තීන්දුව ගත්තාට මෙය මිලදී අරන් නෑ.මේ ගැන තවත් විස්තර ලබා දෙන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

අංක 99.සබාවේ ගිනිගත්ත වාහනය පැටවීමට තිබුනා.මෙය විශාල වියදමක්.එසේම අංක 96 ගල්කුඩු සඳහා අතින් මුදල් දැරුවේ ඇයි?මිල ගනන් කැඳවුවාද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

ගෙනියන්න බෑ.මෙය පොලිසියට ඉදිරිපත්කල යුතුව තිබුනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-

සභාවේ ඇති වාහන ප්‍රමානයට එක් එක් වාහනයට ඉන්දන ලීටරයට දිවිය හැකි කිලෝ මීටර ප්‍රමානයක් තියෙනවා.ඒ ඒ වාහනයට තෙල් ගහන දිනය ලියාගෙන ක්‍රමවේදයකට නඩත්තු කලොත් ආසන්න ලෙස තෙල් ගහපු, දුවපු දුර හා පිච්චුන තෙල් ප්‍රමානය ගනනය කල හැකියි. ඇත්තටම මේ ක්‍රමවේදයට පුළුවන් වෙයි විනිවිද භාවයකින් යුතුව මසකට යම් තෙල් වියදමක් අඩුකරගන්න.මට එලෙස හැඟී යනවා.සමහර වාහන උදේ ගහලා ආයේ හවස ගහනවා. පුළුවන්වෙයි ඒ වැරදි අවම කර ගන්න.අනිවාර්යෙන් බැකෝ එක මේ ලෙස බලන්න.සත්‍ය ලෙසම වැඩ කරලා තියේද බලන්න.

ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-

මේ තෙල් භාවිතය විධිමත් විය යුතුයි.තෙල් ප්‍රමානයත් වැයවන මුදලත් ඉහලයි.යම් පාලනයක් ඇතිව කටයුතු කරන්න.අරපිරිමැස්මෙන් කටයුතු කරන්න. අත්‍යවශ්‍ය දේට පමනක් යොදාගන්න.දැන් ගොඩක් වැඩ අඩුයි. ක්ෂේත්‍රෙය් .කාර්මික නිලධාරින්ට වැඩ අඩුයි.පාරවල් හදන්න දැන් නෑ. ඉතින් තෙල් වියදම අඩු විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රනසිංහ මහතා :-

**තෙල් පරීක්ෂාව වසරකට වරක් කල යුතුයි.නියමිත ක්‍රමවේදයක් තියෙනවා. ඒ අනුව කල යුතුයි. ජේසිබි තෙල් ගැසීම වැඩ කිරීම තව දුරටත් අධික්ෂනය විය යුතුයි.ඉන්ධන සම්බන්ධ අංක 97 තොරතුරු නිරවද්‍ය විය යුතුයි. මෙහි තොරතුරු පිලිබඳ සත්‍යතාවය තහවුරු විය යුතුයි.මේ තොරතුරු ජේස්බුක් දාලා වෙනත් චිත්‍ර මවයි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

අංක 97 සම්බන්ද ඉන්ධන තොරතුරු නිවැරදි කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-**

මේක වංචාවක් විය හැකියි.නිවැරදි ක්‍රම වේදයට කටයුතු කරන්න.ට්‍රැක්ටර් සම්බන්දවත් ගැටළුවක්.ටයර් කොපමන කල් දුවන්න පුළුවන්ද?නිශ්චිත දුර ප්‍රමාණයක් තියෙනවා.කිලෝ මිටර් ගානටම ඉවත් කරන්න එපා.ඒවා භාවිතා කල හැකි ඒවා තියෙනවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

ඒ ටයර් ගෙනත් නෑ තාම.කැබ් රථය කි.මීටර් 46000ක් දුවන්න පුළුවන්.ඉන්ධන පිලිබඳ සවිස්තරව විස්තර ලබා දෙන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 2022.07.01 **වන දින මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.(2022.07.01)

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මෙය සභාවේ දැන ගැනීම සඳහා යොමු කර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

ආදායම් වියදම් වාර්තා ලබා දිමට කටයුතු කර නැත.

**ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

ශේෂය කියන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

ලක්ෂ 44

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-**

ජල මනු ගේනවද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

පරන මනු අළුත්වැඩියා කරනවා. අළුතින් ගේන්නේ නෑ.

**07 ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**07-01** -2022 මැයි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

2022 පෙ බරවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx2022 මැයි මස මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**07-02** ගෙවීම් වාර්තාව(2022. ජුනි

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2022 ජුනි මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ජයරත්න මහතා :-**

අංක 46 ,සමරතුංග ඉංජිනේරු වාර්තාවට ගෙවිම සම්බන්දව. පහදන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

ඒක රඳවාගැනීමෙන් ගෙවන්නේ.හල්පේ සමගා මාවතේ. ඉංජිනේරු වාර්තාවට ගෙවලා තියෙන්නේ.

**ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

මේ ගෙවීමේ පදනම මොකක්ද?ඉදිරි සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ජයරත්න මහතා :-**

සම්මන්ත්‍රන ශාලාව අංක 97 .මේ පරන ගෙවීමනේද?අද ලිපියට තීන්දු ගන්න බෑ.අපි කලින් තීන්දුවක් ගත්තා.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

ටිකක් ගෙවලා කරගන්න බැරිවෙයි.නිමවෙන්න ඕනි වැඩක්.කොන්ත්‍රාත්කරු කලේ නැත්නම් ආයේ තවත් මිලියන ගානක් වැයවන වැඩක්.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 2022 ජුනි මස ගෙවීම් වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

08 වෙනත් කරුණු

**08-01 විශේෂ මහා සභාව.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2022.07.18 දින පෙ.ව.10ට කුරුවිට නගර සංවර්ධන සැලැස්ම ගැසට් කිරිමට අදාලව කරුනු දැක්විමට ඒ නිලදාරින් එනවා.සභා තීරනයකුත් ගන්න වෙනවා. ඒ නිසා එදිනට විශේස මහා සභාවක් පැවැත්විය යුතුයි. මේ සම්බන්ධව න්‍යාය පත්‍රය එවන්නම්.සහභාගීවෙන්න.දැනුම්දිම සිදු කරන්නම්.

08-02හිටපු ගරු **ප්‍රාදේශීය සභා** **මන්ත්‍රී පද්ම කුමාර මහතා ගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කිරිම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා :-**

1997 වර්ෂයේ සිට වාර දෙකක් තුල එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් මෙතුමා මෙම සභාව තුල සේවය කලා. එතුමාගේ අභාවය පසුගියදා සිදුවු අතර ඒ වෙනුවෙන් එතුමාගේ බිරිඳ, දරුවන් හා ඥාතීන් වෙත ශෝකය පල කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-**

හිටපු ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී පද්ම කුමාර මහතා රජයේ සේවකයෙක්.වාර දෙකක් ජය ගත්තා.එතුමා සරල නිහඬ චරිතයක්. එතුමා මා කුඩා කල සිට දන්නා හඳුනන අයෙක්.කෘතහස්ත විසංවාදීව සිතන දේශපාලයෙක්.එතුමා දේශපාලන සමය තුල ගමට සමාජ සේවා රැසක් කලා.තැපැල් සේවාවත් ඉතාමත් සුහදව ඉටු කලා.සාමදාන විනිශ්චයකාර සේවාවත් කලා.පත්බේරිය සියළු ජනතාවගේ ශෝකයත් එතුමාගේ අභාවය වෙනුවෙන් පවුලේ සැමට ශෝකයත් පල කරනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

පද්මකුමාර මන්ත්‍රිතුමා සියළු දෙනා එක්ක සුහදයි.ඒ කාලේ අඩුම වියදමකින් ජයගත්ත මන්ත්‍රි කෙනෙක්.එතුමා තැපැල් දෙපාර්තමේන්තුවේ.ලියුම් බෙදන ගමන් ජන්දේ ඉල්ලුවේ.අපි චන්දේ වැඩ වලට ගියාමත් අපිට පක්ෂේ අයට අඳුරලා දීලා උදව් කරලා තියෙනවා.විකල්ප මත තිබුනේ.එතුමාගේ අභාවය වෙනුවෙන් **ශෝකය පල කරමි.**

**ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

මෙතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කරමි. එතුමා අවස්ථා දෙකක් සභාව නියෝජනය කලා.එතුමා මට මතකයි බෝපත් ඇල්ල විදුලි බලාගාරයක් හදන්න යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබුන වෙලාවේ තමන්ගේ විරෝධතාවය දක්වලා ඒ යෝජනාව පරාජය කලා.අඩු මුදලින් මනාප ජයගත්තා.සරල චරිතයක්. මිතුරෙක්.පවුලේ සියළු දෙනාට ශෝකය පල කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

ගරු විජේසිරි මන්ත්‍රිතුමා යෝජනා කල ආකාරයෙන් අපි සියළු දෙනාම සභාවේ මන්ත්‍රිවරුන් ලෙස හිටපු ගරු මන්ත්‍රි පද්මකුමාර මහතා ගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කරමු.අපිත් එක්ක සුහදව කටයුතු කලා.

08-03 කුරුවිට නව නගර සම්මන්ත්‍රන ශාලාව ඉදි කිරිම-11 අදියර

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

කුරුවිට නව නගර සම්මන්ත්‍රන ශාලාව ඉදි කිරිම-11 අදියර සම්බන්ධන කොන්ත්‍රාත් කරු මොහාන් එන්ට්‍රප්‍රයිසස් වෙතින් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත්කර තියෙනවා.ඒ අනුව ඔහු විසින්

මේවනවිට අදාල කර්මාන්තය සඳහා මිලියන 14 ක බිල්පත් ඉදිරිපත් කර තිබුනද මිලියන දෙකක පමනක් ගෙවීමක් සිදු කර ඇති බවත් තමන් විසින් ඉදිරිපත්කල බිල්පත්වෙනුවෙන් අඩක වටිනාකමක් ගෙවන ලෙස ලබාගෙන ඇති සභා තීරනය අනුව තමන් බලවත් අපහසුතාවයට පත්වන බවත් ඉදිකිරිම් ද්‍රව්‍යවල මිල ගනන් ඉහල යාම,බැංකු අයිරා පොලිය ඉහල යාම හේතුවෙන් තව දුරටත් මුදල් වියදම් කරමින් මෙම කර්මාන්තය කරගෙන යාමට නොහැකි බවත් බිල්පත් වලට මුදල් ගෙවීමෙන් පසුව ඉතිරි වැඩ අවසන් කිරිමට බලාපොරොත්තු වන බවත් දන්වා ඇත.එසේම පලමු හා දෙවන අධියර පැරනි මිල ගනන් යටතේ නියමිත වේලාවට සිදුකිරිම තුලින් ප්‍රාේදේශිය සභාවට විශාල මූල්‍ය ප්‍රතිලාභයක් ලබාදුන් බවත් දැනට පවතින මිල ගනන් අනුව එය රු.මිලියන 80 පමන වන බවත් දන්වා ඇත.ඒ අනුව බිල්පත්වලට මුදල් ගෙවන ලෙස ඉල්ලා ඇත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා :-</u>

මෙම ඉල්ලීම සාධාරන ඉල්ලිමක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>

කුරුවිට සම්මන්ත්‍රන ශාලාව අත්‍යවශ්‍යයයි.අපේ කාලය තුල නිම කල හැකිනම් එය ගෞරවයක්.එසේම මේ ඉල්ලිම සාධාරනයි.මුදල් හැකිනම් ගෙවන්න. මේ ඉතිරි වැඩ කොටස්ද මුල්‍ය තත්වය සලකා බලා නිම කරන්න.ටෙන්ඩර් කල කාලේ වෙන කව්රුවත් ඉදිරිපත් උනේ නැ.මොහාන් විතරයි.මා සමග පාසැල් ගිය දන්නා අයෙක්.වැඩේ ප්‍රමිතියට කරලානම් ඉතිරි වැඩත් නිම කලා නම් හොඳයි.කුරුවිට ප්‍රධාන නගරය ආදායම් ලැබෙන ප්‍රධාන ක්‍රමයක්.ප්‍රෙද්ශයේ ජනතාවට අධ්‍යාපනික වගේම වේදිකා නාට්‍ය, ආදිය රගදැක්විම ආදි කටයුතු වලට මේක වැදගත්.ඒකට සුදුසුම ස්ථානයේ මේ ඉදිකිරීම කරලා තියෙන්නේ.වැඩ නිම කලොත් ආඩම්බරයක්.පැවතුන මිල ගනන් වෙනස් විම,සමාජයේ වු ගැටළු,මත ගිවිසුම් කාලය දික්කිරිම අත්‍යවශ්‍ය වුනා. ක්‍රමවේදයක් අනුව මුදල් ගෙවා අවසන් කල හැකිනම් වැදගත්.මම නැවත ජන්දය නොඉල්ලාවි.නමුත් සභාවේ ආදායම් උත්පාදනයට ඉඩ දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන රනසිංහ මහතා :-</u>

ගියවර සභාවේ මේ ගැන දිර්ඝ ලෙස සාකච්ජා කලා.ගත් තීන්දු වෙනස් කරන්න බැ.සබා තීන්දුවක් ගත්තා.අසාධාරන වෙන්න බැ.ඒ තින්දුව මේ වෙන කොට තත්වය කුමක්ද?බිලෙන් අඩක් ගෙවන්න ගත්ත තින්දුව.අර මුදල් සබාවට ලැබුනාද? නැත්නම් ලැබෙන දිනය කුමක්ද?

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

සභාව දැනුවත් කලේ.මුද්දර ගාස්තු තාම ලැබුනේ නැ.ඒ අතර මෙතුමා මේ ඉල්ලිම කලේ.මේ සම්මන්ත්‍රනශාලාව රටටම හඳන එකක්.මේක අපිට එල්ලාවල කිරිඇල්ල දොඩම්පේ පරකඩුවේ හදන්න බැ.කුරුවිට කේන්ද්‍රස්ථානය.විශ්වාස කරනවා මේකයි සුදුසු තැන.නමුත් දැන් වැඩ කබාට පස්සේ මුදල් දෙන්න බැ.මුදල් තාම ලැබිලා නැ. අපි උත්තර දෙන්න ඕනි.ගිනුමේ ලක්ස 28,ස්තිර තැන්පතුවේ ලක්ෂ 192 ක් තියෙනවා.පැහැදිලි උත්තරයක් දෙන්න ඕනි.මුදල් ලැබෙන දිනයක් කියන්න බැ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන රනසිංහ මහතා :-</u>

මේක කාරක සභාවක් හරිවෙලා කතා කරමු.කොමසාරිස්තුමා දැනුවත් කරමු මේ ගැන.උත්තරයක් හොයමු.

<u>ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

මේ ලිපිය සභාගත කරලා මේ ඉල්ලිම ගරු ආන්ඩුකාරතුමාට සබා තීන්දුව අරිමු.තොරතුරු දන්වලා මේ කාලය අවසන් වෙන බැවින් මුදල් ලබාදෙන්න කියලා අපි ඉල්ලිම කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන රනසිංහ මහතා :-**

මීට වඩා උනන්දු වෙන්න ඕනි.ආන්ඩුකාරතුමා එක්ක සාකච්ඡා කරන්න අද වෙනතුරුත් දිනයක් නෑ.සාකච්ජාවල ප්‍රතිපලයක් ඕනි.ඇයි නොගියේ එතුමා හමුවෙන්න.නායකත්වය එක්ක යන්න ඕනි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

පළාත් සභාවේ දෙවන කාර්තුවේ මුදල් ඉවරයි.30න් පස්සේ.ප්‍රධාන ලේකම, ක්‍රමසම්පාදනය හා කොමසාරිස් තුමා එක්ක කතා කලා.එක්කෝටි අනුදෙලක්ෂයක් තියෙනවා.මන්ත්‍රි යෝජනා.දීප්තිමන්ත්‍රි මහින්ද මන්ත්‍රී,කැළුම් මන්ත්‍රි,තුමන්ලාගෙත් යෝජනා තියෙනවා.ඒ මුදල් ටික අඩුවෙන්නඕනි.මිලියන 10 ක් දෙන්න පුළුවන්නම් එක්කෝටි විසි ලක්ෂයක් දිලා එතකොට.වැඩ අවසන් ඇස්තමේන්තු බිල.වැඩ අවසන් කරන්න මුදල් ඉල්ලනවා.කෝටිය ගෙව්වාම තීන්දුවක් ගමු.මේ වැඩේ කලාම මුදල් සේරමඕනිලු.එතුමා ඉල්ලනවා.එක්කෝටි හතලිස් හත් ලක්ෂයක .වැඩ අවසන් මුදලත්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

පරිපූරක දැම්මා.ඒමුදල්.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

ඒක ගිය සභාවෙත් කිව්වා.මගේ යුතුකම මේක දැනුවත් කිරිම.මේකටත් අමතරව එක්කෝටි ගානක ගෙවීමට තියෙනවා.ලබන සබාවේ තීරනයක් ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-**

මුළු ගොඩනැගිල්ලේ වැඩ අවසන්ද?

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

වැඩ නැවැත්තුවොත් ඒ ටිකට විශාල මුදලක් යයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

කාර්මික නිලධාරිගෙන් ඉතිරි වැඩ ටික පිළිබඳ විස්තර ගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන රනසිංහ මහතා :-**

කොමසාරිස් තුමාගෙන් සාකච්ජාවක් ගන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

ඒක කලා.කතා කලා.30 න් ඉවරයි.11 කාර්තුව.111කාර්තුවෙන් තමයි මුදල් දෙන්නේ.මේ සම්බන්ධයෙන් තීරනයක් ගමු.

08-04 ජල මාර්ගය අපවිත්‍ර විම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

නඩුකාරදෙනිය ග්‍රාමසේවා වසමට අයත් වෙල්යාය අසලින් ගලා බසින ඇල මාර්ගය දින කිපයක සිට මල මුත්‍රා ගඳින් යුතුබව දන්වා නඩුකාරදෙනිය ගම්වාසින් අත්සන් 16කින් යුත්තව පැමිනිලි කර ඇත.ඒ හේතුව නිසා ඇල මාර්ගය දෙපස ඇති ලිං අපවිත්‍රවි ඇති අතර ස්වසන අපහසුතා සහ පාරිසරික හානි සිදුවි ඇති බවත් දනවා ඇත.හයිඩ්‍රාමනී ආයතනයේ කුරුවිට දෙසට ඇති ගේට්ටුව දක්වාම දුගද පවතින බවත් මැදිහත්වි මෙම පීඩාව ඉවත් කර දෙන ලෙසත් ඉල්ලා ඇත.මෙම

ගාමන්ට් එක ලග ඇති ඉඩම සැලසුම් අනුමත කරන කොට ගැටළු ඇතිවයි කරලා තියෙන්නේ.දැන් ගමේ අයට පීඩා.වාර්තා අරන් පීඩාව ඉවත් කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-
මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තා අරන් ඉදිරි කටයුතු කරමු.

08-05 වාහන රියදුරන් සමග සාකච්ඡාව.
සභාවේ ඉන්ධන හා අනෙකුත් වාහන පිලිබද සාකච්ජා කිරිමට සාකච්ජාවක් කැදවන්න. එය විශේෂ සභා දිනට හෝ කරමු.

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022.07.08 දින පැවති මහා සභාවේ වෙනත් කරුනු අංක 08-06**

08-06 සහල් සහනාධාර සම්බන්දව.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-**

මේ වන විට විවිධ ආධාර සමෘර්ධි හාල් ,මුදල් , ආදිය දෙනවා. නමුත් කොට්ඨාශ මන්ත්‍රී කුමන හෝ දැනුවත් වීමක් නෑ මේ දෙන පදනම ගැන. ජනතතාව ප්‍රශ්න කරන කොට මන්ත්‍රී අසරන වෙනවා.ඉන්දන, විදුලිය, විරැකියාව,ගෑස්,ජනතා ප්‍රශ්න නිසා පාරේ බැහැලා යන්න බෑ.දැන් හාල් මුදල් සහනාධාර දෙනවා.මේ හාල් ගන්න මිනිස්සු යන්නේ පයින් සමෘර්ධි ය තියෙන බොහොමයක් අය ශක්තිමත් අය. ඊටත් වඩා අසරන අය ඉන්නවා.හාල් කිලෝ 10 යි රු.5000.00 යි දෙනවා නම් හැමෝටම දෙන්න වෙන තත්වයට පත්වෙලා.මේ ආර්ථිකය හැමෝම පහත් තත්වයට ඇද දමලා.සමෘර්ධි මේ ආධාරය දෙන පදනම මොකක්ද?යමක් තියෙන අයටයි දෙන්නේ . අපේ මන්ත්‍රිතුමන්ලාත් ඉන්නවා සමෘර්ධි. මට මේ දෙන පදනම කියන්න.අපිව ජනතාව පත්කරලා එච්චට දැන් අපිටම ලැජ්ජයි.බරපතල ප්‍රශ්න.එජාප සමෘර්ධි අයව ගෙදරයන්න කියලා. මෙහෙට එන්න කියලා. අපිට ලැජ්ජයි.පැල බෙදලා. ඒවා අසාර්ථකයි.මහජන මුදල්.අන්තිම අඩියේ ඉන්න ජනතාවට තවත් පීඩා.ගල් ගහයි මේ විධිහට.ප්‍රාදේශිය සභාවටත් ඇගිල්ල දික් වෙලයි තියෙන්නේ.හාල් මුදල් මේ වෙලාවේ ඉතා වටිනවා.මේ අකටයුතු ගැන සොයන්න.මේ ගැන විස්තර කියන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී චන්ද්‍රා බන්ඩාර මිය.:-**
පසුගියදා රුවන් මන්ත්‍රිතුමා එතුමාගේ කොට්ඨාශයට ඒ ආධාරය දුන්නා.ඒ දුන්න අය අතර සමෘර්ධියට සුදුසුකම් කියන්න බැරි අයත් හිටියා. පොරොත්තු ලේඛනයේලු.පොහොට්ටුවේ අය.මුද්දර නෑ.විෂ්නු දේවාලේ කෙනාටත් දුන්න.කිලෝ 60 ක් දීලා.ඔප්පු කල හැකියි.මේ සම්බන්ධව තොරතුරු දක්වන්න.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-**
කාහේන්ගම ඒ ආධාරය දුන්න ලැයිස්තුව තියෙනවා. සියල්ල පරීක්ෂා කර බලන්න.දීපු අය.නිවැරදිව ලබා දී තියෙනවා.
මේ අවස්ථාවේදි අදාල ලේඛනය ගරු මන්ත්‍රිතුමිය වෙත පරික්ෂා කිරීම සඳහා ලබාදෙන ලදී.
**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

මේක මිනිස්සුන්ගේ දරිද්‍රතාවය අඩු කරගන්න දෙන සහනයක්.සමෘර්ධිලාභී අයට,පොරොත්තු ලේඛනයට ,ආබාධිත අයට ආදි ලෙස දුන්නා.රජයේ නිලධාරින්ට නෑ.
වගකීම ග්‍රාම නිලධාරීන් , සංවර්ධන නිලදාරින් ආර්ථික සංවර්ධන නිලධාරීන් .ඉතින් මේ විධිහට ඇත්තටම අවශ්‍ය කෙනාට සුදුසු කෙනාට විතරක් දෙන්න ඕනි.හාල් කිලෝ 60ක් එක් කෙනෙකුට දුන්නා කියන එක ෂාපයක්.හැබැයි මේ කියන ඒවා ඔප්පු කරන්නත් හැකි වෙන්න ඕනි.එහෙම වෙලා නම් පැමිනිල්ලක් දාන්න වෙයි.මේක සභාවේ ගත් තීන්දුවක් ලෙස පැමිනිලි කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-**

හාල් බානවට වෙනම දුන්නා.දැක්ක නිසා කියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා :-**

මේක ලෝක බැංකු ආධාරයක් .ඒකත් ගහනවා නම් අජීර්ණය වෙන්න ඕනි.ගමේ අයට හාල් ගෙනියන්න විධිහක් නෑ.ප්‍රාදේශිය ලේකම්ටත් කතා කලා.ලොරි අරන් ගමෙන් යන්න ඕනි හාල් ටික ගේන්න.සඳුදට හාල් ටික ගෙනියනවා.මේ වගේ දේට එසැනින් ක්‍රියාත්මක වෙන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

අකටයුත්තක් සිදුවේ නම් පොලිසියට පැමිනිලි කරමු.අපිත් එනවා. අපි පිට රටට පවා හාල් දුන්න ජාතියක්.දැන් තමිල්නාඩුවෙන් අපේ ජාතියට හාල් දෙනවා.ලැජ්ජයි.මම මගේ කොට්ඨාශයේ ගැටළුවක් නැතිව හාල් දුන්නා.නඩුකාරදෙනිය වසමේ 2 කට නෑ.වලදූර වසමේ 14 ක්.2021 ජුනි හදපු ලේඛනය අනුව.ඊට පස්සේ හදපු ගෙවල් ඒවා.මම ඒවාටත් ප්‍රාෙද්ශිය ලේකම්ට ලිපි දුන්නා.අපේ ගමේ හොදින් ඒ වැඩේ කෙරුනා.අනුනගෙන් ලැබුන ආධාරයත් හොරකම් කලා නම් වැරදියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා :-**

කොරෝනා ආධාර දෙනකොට ඒ මන්ත්‍රී අධීක්ෂනය කලා. දැන් මොකවත් නෑ.රු. 5000.00 ගැන ඇහුවම සමෘර්ධි නිලධාරින් කියලා නෑ කියලා.නමුත් මේක ගැටළුවක්.මම කීවේ ප්‍රාදේශිය ලේකම් හමුවෙන්න කියලා.ඒ කීවම දිලා.සර්ට කතා කලාම හරි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති චන්දන මහතා :-**

එක ගෙදරට කිලෝ 60ක් දෙන්නේ කොහොමද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-**

හාල් බෑවෙත් කුලියට .නමුත් ඒ කුලියට වැඩ කල කීප දෙනාත් සමෘර්ධිය තියෙන අය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි චන්ද්‍රා බන්ඩාර මිය.:-**

ගාමිනි ,උදාර,කඩවතආරච්චි අයටත් මේක ලැබුනේ කොහොමද?පුත්‍යාට ලැබුනේ කොහොමද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-**

ගාමිණිගේ එක පවුලයි.පුතා වෙනම පවුලක්.සමෘර්ධිය ඇති හා පොරොත්තුලේඛනය පරිදි දුන්නේ.දේවාලේ පුත්‍යා සුසන්ත පොරොත්තු ලේඛනයේ ඉන්නවා.පවුල් තුනක් ඉන්නවා.මේ සියළු තොරතුරු ප්‍රාෙද්ශිය ලේකම් වරයා සතුව තියෙනවා. ඒවාත් බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා :-**

මගේ කොට්ටාසේ පොරොත්තු ලේඛනයේ අයට දිලා නෑ.ඒ පිලිබද විමසිය යුතුයි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

මේ පිලිබද නිවැරදි තොරතුරු ලබාගෙන ඉදිරි කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

පිටකන්ද පාරට නඩු දානවා කීවා.කාර්මික නිලධාරි මගින් අවශ්‍ය තොරතුරු ගෙන කඩිනම් කරන්න.

-09-හදිසි යෝජනා

09-01 <u>නිවාඩු අනුමත කිරීම</u>

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මාලනි පීරිස් මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසසිරි ප්‍රභාත් මහතා, හදිසියේ_අසනීප වී ඇති අතර නිවාඩු ලබා දිමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

<u>ගරු උපසභාපති අසංක දිල්ෂාන් මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මාලනි පීරිස් මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසසිරි ප්‍රභාත් මහතා,යන පිරිස හදිසියේ අසනීප වි ඇති අතර නිවාඩු ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

- **ස්තුතිය.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

අද දින මහා සභාව සඳහා සහභාගිවී සහය ලබාදුන් සියළු දෙනා හට ස්තුතිය පල කරමි. සභාවේ කටයුතු ප.ව. 2.00 ට අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)